*සැ. යු.-* 2013.12.20 දින පළ වූ අංක 1,842 දරන *ගැසට් පත්‍රයේ* I:III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,843 - 2013 දෙසැම්බර් මස 27 වැනි සිකුරාදා - 2013.12.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 2090 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 2098 |

*සැ. යු.-* දයා සරණ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2013 දෙසැම්බර් මස 06 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 ජනවාරි මස 17 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 ජනවාරි මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2087- B 80796—3,820 (2013/12)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

“1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත”

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ භාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — පුත්තලම දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්‍ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 ජනවාරි මස 27 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 දෙසැම්බර් මස 05 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| පුත්තලම | කල්පිටිය | නොරොච්චෝලේ කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම. |

12-986

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කළුතර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

03. මෙම තනතුරු සඳහා මුස්ලිම් පුරුෂ පක්‍ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 ජනවාරි මස 27 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 දෙසැම්බර් මස 04 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| කළුතර | බේරුවල | කළුතර හා පානදුර තොටමුණ කොට්ඨාසයේ මරදාන ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර. |

12-985

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — බදුල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 ජනවාරි මස 27 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 දෙසැම්බර් මස 11 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| බදුල්ල | ඌව පරණගම | උඩුකිඳ (උඩුහාවර හා පරණගම) කොට්ඨාසයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල. |

12-1233

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — අනුරාධපුර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 ජනවාරි මස 27 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 දෙසැම්බර් මස 09 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| අනුරාධපුර | මධ්‍යම නුවරගම් පළාත | ගම්බිරිස්ගස්වැව කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ නුවරගම් පළාත කොට්ඨාසයේ විවාහ රෙජිස්ට්‍රාර් ධුරය (උඩරට/ සාමාන්‍ය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුර |

12-1078

**ගොවිජන විනිශ්චය සභා පත්කිරීම - 2014/2017**

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**

වසර 03ක කාලයක් සඳහා ගොවිජන විනිශ්චය සභා 25ක් පත් කිරීම වෙනුවෙන් 2011 අංක 46 දරන පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත යටතේ ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වන මා විසින් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

මෙහි පහත දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව අයදුම්කරු විසින් පිළියෙල කරගත් අයදුම්පත් 2014 ජනවාරි මස 27 වැනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් මා වෙත ලැබෙන සේ එවිය යුතු ය. අයදුම්පත්‍රය බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ගොවිජන විනිශ්චය සභා" යනුවෙන් සඳහන් කල යුතු ය. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව මා වෙත ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් සමග ලිපි ලේඛනාදියෙහි මුල්පිටපත් එවිය යුතු නොවේ.

*සැ. යු.*- ආදර්ශ අයදුම්පත්‍ර අනුව පිළියෙල නොකල අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

02. *බඳවා ගැනීමේ ක්‍රමය* :
නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබාගන්නා අපේක්ෂකයින් පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවාගනු ලැබේ.

03. *වයස් සීමාව* :
අයඳුම්කරු වයස අවුරුදු 70 නොඉක්මවූ අයකු විය යුතු ය.

04. සුදුසුකම් :

1. අවුරුදු 7කට වඩා පලපුරුද්ද සහිත විශ්‍රාමික විනිසුරුවරයකු ;
2. විධායක මට්ටමේ වසර 7ක සේවා කාලයක් සහිත විශ්‍රාමික රාජ්‍ය නිලධරයකු (ක්ෂේත්‍රයේ පලපුරුද්ද පිළිබඳව මෙහි දී විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.)

05. *බඳවා ගනු ලබන සංඛ්‍යාව* : 25 දෙනකු

06. *බඳවා ගනු ලබන කාල සීමාව* : වසර 03 ක් සඳහා

07. (*අ*) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.
(*ආ*) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

08. පහත සඳහන් ලිපිලේඛනවලින් එකක් හෝ සියල්ලම හෝ ඉල්ලා සිටි විට ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන්ට හැකිවිය යුතුය.

(*අ*) උප්පැන්න සහතිකය ;
(*ආ*) සේවා සහතික ;
(*ඇ*) වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික ;
(*ඈ*) සිංහලෙන්/දෙමළෙන්/ඉංග්‍රීසියෙන් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතික.

09. මෙම තනතුර සඳහා බඳවා ගන්නා නිලධාරීන් ලංකාවේ ඕනෑම දිස්ත්‍රික්කයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

10. මෙම තනතුර සඳහා මාසික රු. 28,740 ක දීමනාවක් සහ රු. 5,000 ක මාසික අමතර ප්‍රවාහන දීමනාවක් ගෙවනු ලැබේ.

එම්. ඒ. එස්. වීරසිංහ,
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

2013 දෙසැම්බර් මස 11 වැනි දින.

***ආදර්ශ අයදුම්පත***

*ගොවිජන විනිශ්චය සභාව සඳහා පත් කිරීම*

**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**

1. සම්පූර්ණ නම :—————.
2. මුලකුරු සමග නම :—————.
3. ස්ථිර පදිංචිය :—————.
4. ලිපිනය :—————.
5. උපන් දිනය : වර්ෂය :—————. මාසය :—————. දිනය :—————.
6. වයස : අවු. :—————. මාස :—————. දින :—————.
7. ජාතිය :—————.
8. ආගම :—————.

9. විවාහක/අවිවාහක බව :————.

10. ජා. හැ. ප. අංකය :————.

11. දුරකථන අංකය :————.

12. අධ්‍යාපන සුදුසුකම් :————.

13. සේවා පලපුරුද්ද :————.

14. වෘත්තීය සුදුසුකම් :————.

15. කියවීමට, ලිවීමට සහ කථා කිරීමට හැකි භාෂාවන් ඃ
(අදාළ කොටුවේ (✓) යොදන්න.)

| | කියවීම | | | ලිවීම | | | කථාකිරීම | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | විශිෂ්ටයි | හොඳයි | දුර්වලයි | විශිෂ්ටයි | හොඳයි | දුර්වලයි | විශිෂ්ටයි | හොඳයි | දුර්වලයි |
| සිංහල | | | | | | | | | |
| දෙමළ | | | | | | | | | |
| ඉංග්‍රීසි | | | | | | | | | |

16. ගොවිජන සංවර්ධන නීතිය පිළිබඳ දැනීමක් තිබේද? ඔව්/නැත
ඔව් නම්, එම දැනුම ලබාගත් ආකාරය :————.

17. ඔබ විශ්‍රාමික විනිසුරුවරයෙක් ද? නැතහොත් විශ්‍රාමික රජයේ නිලධාරියෙක් ද?
(අදාළ කොටුවේ (✓) යොදන්න.)

| | |
|---|---|
| 01 විශ්‍රාමික විනිසුරුවරයෙක් | |
| 02 විශ්‍රාමික රජයේ නිලධාරියෙක් | |

18. සේවා තොරතුරු ඃ

| සේවාව | රැකියා කාලය | | දරන ලද තනතුර | සේවා ස්ථානය |
|---|---|---|---|---|
| | සිට | දක්වා | | |
| | | | | |
| | | | | |
| | | | | |

19. දේපලවල වටිනාකම ඃ රු. :————.

20. මාසික ආදායම රු. :————.

21. පසුගිය අවුරුදු 10 තුළ ඔබ ක්‍රියාකාරීව දේශපාලන කටයුතුවල නිරතව සිටියේ ද ? :————.

22. ආදායම් බදු ගෙවන්නෙක් ද ? :————.

23. ඔබට එරෙහිව අධිකරණයක අපරාධ නඩු තිබේ ද? :————.

කිසියම් අධිකරණයකින් අපරාධ නඩු සඳහා ඔබව වරදකරු කර තිබේ ද? :————.

24. උසාවිවලින් දඬුවම් ලබා ඇතොත් ඒවායේ විස්තර :————.

25. පෞද්ගලික තොරතුරු විමසිය හැකි අය (ඒ අය ඔබව හොඳින් දන්නා වගකිව යුතු පුද්ගලයන් විය යුතුය.)

| (1) | (2) |
|---|---|
| නම : | නම : |
| ලිපිනය : | ලිපිනය : |
| රක්ෂාව : | රක්ෂාව : |
| දුරකථන අංකය : | දුරකථන අංකය : |
| ඔබ දැන සිටින කාලය : | ඔබ දැන සිටින කාලය : |

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බැව් සහතික කරමි.

—————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :—————.

සටහන : (සියලුම සහතිකයන්හි පිටපත් ද මෙයට අමුණන්න)

12-1163

---

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ II වන ශ්‍රේණියේ II වන පන්තියේ පශු වෛද්‍ය නිලධාරී තනතුරු පුරප්පාඩුවලට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම 2013 (II වන අදියර)

ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ II වන ශ්‍රේණියේ II වන පන්තියේ පශු වෛද්‍ය නිලධාරී තනතුරුවල 2013.09.30 දිනට පැවති පුරප්පාඩු 40 (හතළිහ) ක් සඳහා පත්කිරීමට සුදුස්සන් තෝරා ගැනීම සඳහා පශු වෛද්‍ය විද්‍යා උපාධිධාරීන්ගෙන්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර, අධ්‍යක්ෂ ජනරාල්, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම්පස උඩ කෙලවරේ "ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ II වන පන්තියේ II වන ශ්‍රේණියේ පශු වෛද්‍ය නිලධාරී තනතුර" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2014.01.17 දින වේ.

සටහන :

* ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සළකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතු ය. මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

* පශු වෛද්‍ය නිලධාරී තනතුරු සඳහා බඳවා ගනු ලබන්නන් පත්වීමේ දින සිට අවුරුදු 03 ක කාලයක් උතුරු හා නැගෙනහිර පළාත්වල සේවය කළ යුතු ය.

(1.) *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) පශු වෛද්‍ය නිලධාරී තනතුරුවල පවතින පුරප්පාඩු සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පශු වෛද්‍ය පීඨය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන කුසලතා ලේඛනය මත බඳවා ගනු ලබනවා ඇත. පිළිගත් විදේශ විශ්ව විද්‍යාලයකින් පශු වෛද්‍ය උපාධි සුදුසුකම් ලබා ගන්නා අයදුම්කරුවන් ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචිය සඳහා සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන වසරට අදාළව ලියාපදිංචි දිනය අනුව අනුපිළිවෙලින්, කුසලතා ලේඛනයේ අවසානයට ඇතුළත් කරනු ඇත.

(ii) කුසලතා ලේඛනයේ අනුපිළිවෙල අනුව වෙන් කර ඇති පුරප්පාඩු සංඛ්‍යාව පදනම් කර ගනිමින් එම පුරප්පාඩු සංඛ්‍යාව මෙන් සියයට එකසිය දහයක (110%) අයදුම්කරුවන් ප්‍රමාණයක් සම්මුඛ පරීක්ෂණයට කැඳවා අදාළ බඳවා ගැනීම සිදු කරනු ඇත. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමක් සිදු නොකෙරේ.

(iii) පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

2. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) තෝරා ගනු ලබන අයදුම්කරුවන් ඔවුන් විසින් අයදුම්කරනු ලබන ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවේ උපලේඛනගත තනතුරක් පිරවීම සඳහා පත්කරනු ලැබේ.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 7/2007 (II) අනුව අනෙක් භාෂාව පිළිබඳ ප්‍රවීණතා මට්ටම වසර 05ක් තුළ දී ලබාගත යුතු ය. රාජ්‍ය භාෂාවකින් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු

නිලධාරීන් විසින් වසර 03ක් තුළ දී එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳව ප්‍රවීණතාවය ලබා ගත යුතු අතර, අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය වසර හයක් (06) ඇතුළත ලබා ගත යුතුය. 1 කාණ්ඩයට අයත් දෙවන රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතා මට්ටම ලබාගත යුතු ය.

(iv) සෙසු සේවා නියමයන් සහ සේවා කොන්දේසි 1980.10.31 දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ හා වරින්වර නිකුත් කරන ලද සංශෝධන නියමයන්වලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

3. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට SL - 1-2006 රු. 22,935 - 10 x 645 - 8 x 790 - 17 x 1050 - රු. 53,555 මාසික වැටුප් ප්‍රමාණයක් හිමිය.

(2006.04.25 දිනැති රා. ප. ච. අංක 6/2006 හි අංක SL - 1- 2006 වැටුප් බාණ්ඩය)

4. *අධ්‍යාපන සුදුසුකම් :*

පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් පශු වෛද්‍ය විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු උපාධියක්.

5. *වයස් සීමාව :*

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර උපරිම වයස අවුරුදු 35ට නොවැඩි විය යුතු ය.

6. *කායික සුදුසුකම් :*

(i) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්;

(ii) තනතුරෙහි රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු අතර, මනා ශරීර සෞඛ්‍ය තත්වය වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මඟින් සනාථ විය යුතු ය.

7. *වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.

(ii) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

(iii) පශු වෛද්‍ය උපාධියේ වලංගු දිනය 2010.12.31 හෝ ඊට ප්‍රථම දිනයක් විය යුතු වීම හා ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබිය යුතු ය.

(iv) අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

8. *සම්මුඛ පරීක්ෂණය :*

8.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : (ලකුණු ලබාදෙනු නොලැබේ.)

*ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු.*—බඳවා ගැනීමේ පරිපාටි හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම

9. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය :*

(i) ඉල්ලුම් පත්‍රය සෙ. මී. 22-29 ප්‍රමාණයේ A4 කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සකස් කල යුතුය.

(ii) සම්මුඛ පරීක්ෂණය සඳහා දැනුම් දුන් විට පහත සඳහන් ලියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කල යුතුය.

(*අ*) උප්පැන්න සහතිකය,
(*ආ*) උපාධි හා අදාළ වෙනත් සහතික,
(*ඇ*) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් (මින් එකක් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිගෙන් ලබාගත් හා ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කල විය යුතුය.)
(*ඈ*) සිංහල/දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් සමත් වූ උසස්ම විභාගවල සහතික,
(*ඉ*) පශු වෛද්‍යවරයෙකු වශයෙන් ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචි වීමේ සහතිකය.

10. *වෙනත් විධිවිධාන :*

(i) මෙම *ගැසට් නිවේදනයේ* විධිවිධාන පනවා නොමැති කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වනු ඇත.

(ii) පුරප්පාඩු පිරවීම, නොපිරවීම හෝ කොටසක් පමණක් පිරවීම පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

(iii) මෙම *ගැසට් නිවේදනය* සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨ බල පැවැත්විය යුතුය.

(iv) අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු වනු ඇත.

(v) අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින් යටපත් කර ඇතිනම් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

කේ. එම්. ටී. කැඳරගම,
ලේකම්,
පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය.

:———————.



ආදර්ශ අයදුම්පත

ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ II වැනි පන්තියේ II වන ශ්‍රේණියේ පශු වෛද්‍ය නිලධාරි පුරප්පාඩුවලට බඳවා ගැනීමේ අයදුම්පත

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

01. (i) මුල'කුරු සමඟ නම :

සිංහලෙන් :———————.
ඉංග්‍රීසියෙන් (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

(ii) මුල'කුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

02. ජාතික හැඳුනුම්පත් අංකය

03. තැපැල් ලිපිනය :———————.
(ලිපිනයෙහි යම් වෙනසක් සිදු වුවහොත්, වහාම ඒ බව දැනුම් දිය යුතු ය.)

04. ස්ථිර පදිංචි ස්ථානය අයත් :
(i) පළාත් සභාව :———————.
(ii) දිස්ත්‍රික්කය :———————.

05. උපන් දිනය : වර්ෂය :———————. මාසය :———————. දිනය :———————.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු :———————. මාස :———————. දින :———————.

06. (අ) ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද යන බව :———————.

(ආ) ජාතිය (සිංහල/ශ්‍රී ලංකා ද්‍රවිඩ/ඉන්දියානු ද්‍රවිඩ/මුස්ලිම්/වෙනත්) :———————.

07. (අ) ස්ත්‍රී/පුරුෂ භාවය :———————.

(ආ) විවාහක/අවිවාහක/වැන්දඹු ද යන වග :———————.

08. අධ්‍යාපන සුදුසුකම් :

| සමත් වූ උපාධිය/පශ්චාත් උපාධි සුදුසුකම | පන්තිය | විශ්ව විද්‍යාලය | වර්ෂය |
|---|---|---|---|
| 1.<br>2.<br>3. | | | |

09. ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචි අංකය හා දිනය :———————.

10. සේවා විස්තර : (දැනට ස්ථිර තනතුරක් දරන්නේ නම්) :

| දැනට දරන තනතුර | සේවා කාලය | | සේවා ස්ථානය | දෙපාර්තමේන්තුව/ පළාත් සභාව |
|---|---|---|---|---|
| | සිට | දක්වා | | |
| 1.<br>2.<br>3. | | | | |

11. මෙම ඉල්ලුම්පත්‍රයෙහි මවිසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු සත්‍යවූත්, නිවැරදිවූත්, ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි ඒවා බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සෙකු වීමට යටත්වන බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මා කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත්වන බවත්, මම දැන සිටිමි. මම කිසිදු උසාවියකින් සාපරාධි වරදකට වැරදිකරුවකු වී නොමැති බව ද මගේ සුපුරුදු අත්සන තබා මින් සහතික කරමි.

———————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———————.

(දැනට ස්ථිර තනතුරක් දරන අපේක්ෂකයන්ට පමණක් අදාල වේ.)

I. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

ඉහත අයදුම්කරු වූ ....................................... මහතා/මිය./මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/ ......................... පළාත් සභාවේ ......................... තනතුරක් දරන නිලධාරියෙකු බවත් ඉල්ලුම්පත්‍රයේ සඳහන් තොරතුරු ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බවත් සහතික කරමි. මෙම තනතුර සඳහා මෙම නිලධාරියා තේරී පත්වුවහොත් ඔහු/ඇය මෙම දෙපාර්තමේන්තුවෙන්/පළාත් රාජ්‍ය සේවයන් මුදා හැරීමට හැකි/නොහැකි බවත් දන්වමි.

———————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා
(නිල මුද්‍රාව)

දිනය :———————.

ලිපිනය :———————.

12-1221

---

**2013 දෙසැම්බර් මස 13 දින පළ කරනු ලැබූ කුරුණෑගල දිස්ත්‍රික්කයේ අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දඹදෙණි උඩුකහ දකුණ කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ දඹදෙණි හත්පත්තුව කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධුරය සඳහා ඉල්ලුම්පත් කැඳවීමේ දැන්වීම අවලංගු කිරීම**

උක්ත සඳහන් ධුරය සඳහා අංක 1817 සහ 2013.06.28 දිනැති ගැසට් පත්‍රය මගින් ඉල්ලුම්පත් කැඳවා ඇති බැවින් 2013.12.13 දින පළ කරනු ලැබූ එම ගැසට් නිවේදනය මෙයින් අවලංගු කරමි.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 දෙසැම්බර් මස 10 වැනි දින,
බත්තරමුල්ල ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/A3හි
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කුරුණෑගල | අලව්ව | කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙණි උඩුකහ දකුණ කොට්ඨාසයේ උප්පැන්න මරණ හා දඹදෙණි හත්පත්තුව කොට්ඨාසයේ විවාහ රෙජිස්ට්‍රාර් ධුරය (උඩරට/සාමාන්‍ය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල |

12-1234

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**

මිනින්දෝරු දෙපාර්තමේන්තුව

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුර සඳහා පැවැත්වෙන විවෘත තරග විභාගයට සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *පුරප්පාඩු ගණන* : 06

02. *තනතුරේ ස්වභාවය* :
මිනුම් කටයුතුවලට අදාළ උපකරණ හා මෙවලම් නඩත්තු කිරීම සහ සේවා කිරීම.

03. (i) *පෙනී සිටිය යුතු ප්‍රශ්න පත්‍ර* :

| *විෂයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100% | 40% |
| සාමාන්‍ය දැනීම (තනතුරට අදාළ තාක්‍ෂණික දැනුම සහිත ප්‍රශ්න ද ඇතුළත් වේ.) | පැය 01 | 100% | 40% |

(ii) මෙම ප්‍රශ්න පත්‍රවලට ලබා ගන්නා මුළු ලකුණු සංඛ්‍යාව මත තේරීම් කරනු ලැබේ.

04. *බඳවා ගැනීමේ ශ්‍රේණිය* :
මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුරේ III ශ්‍රේණිය

05. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය. පත්වීම් අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වන අතර තෝරා ගනු ලබන නිලධාරීන් කොළඹ ප්‍රධාන කාර්යාලයේ පමණක් සේවය කිරීමට සූදානම්ව සිටිය යුතු ය. මෙම ගැසට් නිවේදනය ආරම්භයේ ඇති රාජ්‍ය සේවයේ පත්කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසිවලට යටත් විය යුතු ය.

06. *වැටුප් පරිමාණය* :

MT1 - 2006 -A- රු. 14,425 - 10 x 145 - 11 x 170 - 6 x 240 - 14 x 320 - රු. 23,665.

ශ්‍රේණි ක්‍රමයට අදාල ආරම්භක වැටුප් පියවර

| *ශ්‍රේණිය* | *ආරම්භක වැටුප් පියවර* | *ආරම්භක වැටුප් තලය* |
|---|---|---|
| III | පියවර 01 | රු. 14,425 |
| II | පියවර 12 | රු. 16,045 |
| I | පියවර 23 | රු. 17,985 |

07. *වයස් සීමාව* :

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ සිටින අයට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

08. *අධ්‍යාපන සුදුසුකම්* :

90% ක් වන බාහිර අයදුම්කරුවන් සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය එකවර විෂයයන් පහක් සහිතව දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සිංහල, හෝ දෙමළ, විද්‍යාව, ගණිතය/අංක ගණිතය යන විෂයයන්ගෙන් තුනකට සම්මාන සහිතව විෂයයන් හයකින් සමත් වීම; සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය, භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් සමත්ව තිබීම; සහ

රජය පිළිගත් කාර්මික විද්‍යාලකින් ඉලෙක්ට්‍රොනික හෝ යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ වූ එක් අවුරුදු පාඨමාලාවක් හදාරා තිබීම.

09. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :

පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ගෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/90 හා අදාළ චක්‍රලේඛ අනුව පත්කිරීම සඳහා තෝරාගනු ලැබේ.

10. සෑම අයදුම්කරුවෙකු ම තනතුරට අදාළ සියලු සුදුසුකම් විභාගය සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්යය වේ.

11. *ඉල්ලුම්පත්‍ර හා අනෙකුත් විස්තර* :

(අ) i. මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සෙන්ටිමීටර 21 x 29 (A4) ප්‍රමාණයේ කඩදාසිවල තමන් ඉල්ලුම්පත්‍ර සකසාගත යුතු අතර ඉල්ලුම්පතේ 01 වැනි පිටුවේ අංක 01 සිට 08 දක්වාත් 02 වැනි පිටුවේ අංක 09-10 (iii) දක්වාත් 03 වැනි පිටුවේ අංක 11 සිට 16 දක්වාත් ඡේදයන් ඇතුළත් විය යුතු අතර විභාග ගාස්තු ගෙවා ලබාගත් කුවිතාන්සිය ඊට පහල කොටසේ ඇලවිය යුතු ය. ඉල්ලුම්පත්‍ර බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුර" යනුවෙන් සඳහන් කර 2014 ජනවාරි 24 දින හෝ ඊට පෙර මැනුම්පති, මිනින්දෝරු දෙපාර්තමේන්තුව, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. (පෞද්ගලික නමට හෝ වෙනත් කිසිදු ලිපිනයකට නොඑවිය යුතු ය.)

ii. අසම්පූර්ණ, නියමිත සුදුසුකම් සපුරා නොමැති හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

iii. තැපෑලේ දී අස්ථාන ගතවන අයදුම්පත්‍ර ගැන වගකියනු නොලැබේ.

iv. මොනම හේතුවක් නිසා හෝ විභාග ගාස්තු ආපසු ගෙවීමක් නොකෙරේ.

v. ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ.

(ආ) ඉල්ලුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විදුහල්පතිවරයෙකු හෝ සමාදාන විනිශ්චයකරුවෙකු හෝ දිවුරුම් කොමසාරිස්වරයෙකු හෝ නීතිඥවරයෙකු හෝ යුද්ධ හමුදාවේ, ගුවන් හමුදාවේ අධිකාරි බලය ලත් නිලධාරියෙකු හෝ පොලිස් සේවයේ ගැසට් කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ශ්‍රේණිගත කිරීම අනුව වෘත්තීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබිය යුතු ය.

12. පහත සඳහන් ලියවිලි ද කැඳවීමක් කරනු ලබන අවස්ථාවක ඉදිරිපත් කළ යුතු ය.

(i) උප්පැන්න සහතිකය;
(ii) අධ්‍යාපන සහතික;
(iii) මෑතක දී ලබාගත් ග්‍රාමසේවා නිලධාරී සහතිකයක්;
(iv) චරිත සහතික දෙකක්.

***සැලකිය යුතුයි.***- ලියකියවිලි හෝ ඒවායේ පිටපත් හෝ ඉල්ලුම්පත්‍රයට අමුණා නොඑවිය යුතු ය.

13. දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවිය යුතු ය.

14. විභාග ගාස්තුව රු. 800 කි. ඕනෑම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයකට විභාග ගාස්තු ගෙවා ලබාගත් රිසිට්පත අයදුම්පතේ ඒ සඳහා වෙන්කර ඇති ස්ථානයේ අලවා තිබිය යුතු ය. මුදල් ඇනවුම් හෝ චෙක්පත් භාරගනු නොලැබේ.

15. *විභාගය පවත්වනු ලබන මධ්‍යස්ථාන.*—ප්‍රධාන කාර්යාලයේ හෝ වෙනත් සුදුසු මධ්‍යස්ථානයක විභාගය පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. විභාගය පැවැත්වෙන දිනය අයදුම්කරුවන් වෙත පසුව දැනුම්දෙනු ලැබේ.

16. *විභාගයට ඇතුළ්වීම* :

අයදුම්පත් එවා ඇති හා මූලික සුදුසුකම් සපුරා ඇති සියලුම අපේක්ෂකයන්ට ඔවුන් අයදුම්පතේ සඳහන් කළ ලිපිනයට ප්‍රවේශපත්‍ර තැපෑලෙන් යැවෙනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු විභාග මධ්‍යස්ථානයේ විභාග ශාලාධිපතිට තම ප්‍රවේශපත්‍රය ඉදිරිපත් කළ යුතු ය. තම ප්‍රවේශපත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී ම විභාගයට පෙනී සිටිය යුතු ය.

*සටහන.*—අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් නොවේ.

17. *අපේක්ෂකයාගේ අනන්‍යතාවය.*—විභාග ශාලාවේ දී එහි විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අයදුම්කරු සිය අනන්‍යතාවය ඔප්පුකර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත;
(ආ) තැපැල්පති විසින් නිකුත් කර ඇති වලංගු හැඳුනුම්පත;
(ඇ) වලංගු ගමන් බලපත්‍රය.

18. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්* :

අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෝ කිසියම් වැදගත් කරුණක් වසන් කර ඇති බව හෝ ඔහු/ඇය තෝරා ගැනීමෙන් පසුව හෙළි වුවහොත් ඔහු/ඇය රාජ්‍ය සේවයෙන් පහකිරීමට ඉඩ ඇත.

19. *භාෂා මාධ්‍ය* :

මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පවත්වනු ලබන අතර අයදුම්කරුවන්ට කැමති මාධ්‍යකින් ඒ සඳහා ඉදිරිපත් විය හැක. අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට අයදුම්කරුවන්ට ඉඩ දෙනු නොලැබේ.

20. මෙම කොන්දේසිවලින් ආවරණය නොවන කරුණු සම්බන්ධයෙන් සර්වේයර් ජනරාල් විසින් තීරණය කෙරෙනු ඇත.

කේ. තවලිංගම්,
සර්වේයර් ජනරාල්.

2013 දෙසැම්බර් මස 13 වැනි දින,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

ආදර්ශ අයදුම්පත්‍රය

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මැනුම් උපකරණ කාර්මික ශිල්පි තනතුර සඳහා තරග විභාගය

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

(දෙන ලද කොටු තුළ සංකේත අංකය යොදන්න)

01. (1) මුලකුරු සමග නම :————.

(i) සිංහලෙන් :————.
(ii) ඉංග්‍රීසියෙන් :————.

(2) මුලකුරුවලින් හැඳින්වෙන නම් : (පැහැදිලි අකුරෙන්)

(i) සිංහලෙන් :————.
(ii) ඉංග්‍රීසියෙන් :————.

02. (i) ස්ථිර ලිපිනය (පැහැදිලි අකුරෙන්) :————.
(ii) ලිපිනය අයත්වන පරිපාලන දිස්ත්‍රික්කය :————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය (පුරුෂ - M, ස්ත්‍රී - F)

04. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
(සිංහල - S, දෙමළ - T, ඉංග්‍රීසි -E)

05. ජන වර්ගය :
(සිංහල -1, ශ්‍රී ලංකා ද්‍රවිඩ -2, මුස්ලිම් - 3, ඉන්දියානු ද්‍රවිඩ - 4, බර්ගර් - 5, මැලේ -6, වෙනත් - 7)

06. (i) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
(ii) ග්‍රාම නිලධාරී කොට්ඨාසය :————.
(iii) දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින්නේ කවදා සිට ද? :————.

07. පුරවැසිභාවය :

පරම්පරාවෙන් : ☐

ලියාපදිංචි වීමෙන් : ☐

08. ජාතික හැඳුනුම්පත් අංකය :————.

09. (i) උපන් දිනය :
වර්ෂය :————. මාසය :————. දිනය :————.

(ii) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස:
වර්ෂ :————. මාස :————. දින :————.

10. අධ්‍යාපන සුදුසුකම් :-

(i) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) පළමුවර
1. විභාග වර්ෂය සහ මාසය :————.
2. අයදුම්කරුගේ විභාග අංකය :————.
3. සමත් වූ විෂයයන් :

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

(ii) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) දෙවැනිවර

1. විභාගය වර්ෂය සහ මාසය :————.
2. අයදුම්කරුගේ විභාග අංකය :————.
3. සමත් වූ විෂයයන් :

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

(iii) අ.පො.ස. (උසස් පෙළ)

1. විභාග වර්ෂය සහ මාසය :————.
2. අයදුම්කරුගේ විභාග අංකය :————.
3. සමත් වූ විෂයයන් :————.

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

11. වෙනත් සුදුසුකම් :————.

12. ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?

ඔව් ☐ නැත ☐

ඔව් නම් විස්තර සඳහන් කරන්න :————.

13. මුදල් ගෙවන ලද මිනින්දෝරු කාර්යාලය :————.

රිසිට්පත් අංකය :————.

මුදල් ගෙවන ලද දිනය :————.

14. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

(ආ) ම විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දැන සිටිමි.

(ඇ) මෙම විභාගයේ කොන්දේසි පිළිපැදීමට එකඟ වෙමි.

(ඈ) රු. ......... ක් ගෙවා ලබාගත් කුවිතාන්සිය ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයේ අලවා ඇත.

දිනය :————. අයදුම්කරුගේ අත්සන :————.

15. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :
මෙම අයදුම්පත ඉදිරිපත් කරන ..................... නමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ........................ දින මා ඉදිරිපිට දී ඉහත අත්සන තබන ලද බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.

සහතික කරන්නාගේ නම :————.

තනතුර :————.

ලිපිනය :————.

(කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න)

16. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :
තෝරා ගනු ලැබුවහොත් මෙම නිලධාරියා මුදාහැරිය හැකිය/නොහැකිය.

_________,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන.

දිනය :————.

12-1185

---

### ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

### ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

### ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන නිලධාරී II වැනි ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2013 (2014)

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට අයත් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී ඇති ගොවිජන සංවර්ධන නිලධාරී තනතුරු සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට යා කර ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව ශීර්ෂ අංක 01 සිට 07 තෙක් පළමුවන පිටුවට ද ශීර්ෂ අංක 08 සිට 12 තෙක් ඊළඟ පිටුවට ද ඇතුළත් වන ලෙස සකස් කර ගත යුතුය.

1.2 අපේක්ෂකයා තමා විභාගයට පෙනී සිටීමට අදහස් කරනු ලබන භාෂා මාධ්‍යයෙන්, තම අත් අකුරින් ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කළ යුතු අතර ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂයේ භාෂා මාධ්‍යයට අදාළ අංකය දී ඇති කොටුවේ නිවැරදිව දැක්විය යුතුය. භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

1.3 ඉල්ලුම් පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යවශය වේ.

1.4 මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් සිංහල හා දෙමළ මාධ්‍යවලින් 2014 මාර්තු මාසයේ දී උපලේඛනය - 1 යටතේ දක්වා ඇති නගරවල පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථාන වලදී පවත්වනවා ඇත. ඒ අනුව විභාගයට පෙනී සිටින නගරය හා ඊට අදාළ අංක පළමු හා දෙවන කැමැත්ත අනුව ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂයේ දක්වා ඇති කොටුව තුළ නිවැරදිව සඳහන් කළ යුතුය. විභාග සඳහා ඉල්ලුම් කළ නගරය/නගර පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. කිසියම් මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් පිරිසක් නොමැති විට අයදුම්කරුගේ දෙවැනි කැමැත්ත අනුව හෝ ආසන්න වෙනත් විභාග මධ්‍යස්ථානයක් වෙත හෝ යොමු කරනු ඇත.

1.5 සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍ර, පෞද්ගලික අයදුම්කරුවන් විසින් සෘජුවම ද, රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් ද 2014.01.27 දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් යොමු කළ යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

ඉල්ලුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළින් "ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන නිළධාරී II වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2013 (2014)" ලෙස සඳහන් කළ යුතුය.

1.6 විභාග නිවේදනයට අනුකූල නොවන, ප්‍රමාද වී ලැබෙන හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර, තැපෑලේ දී සිදුවිය හැකි ප්‍රමාදයන් පිළිබඳව වගකීම භාරගනු නොලැබේ. (සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

1.7 විභාග මධ්‍යස්ථාන පිහිටවනු ලබන නගර හා නගර අංක විභාග නිවේදනයේ අවසානයට උපලේඛනය - 1 ලෙස ඇමුණුමක් සේ දැක්වීම ප්‍රමාණවත් ය.

(2) සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

2.1 මෙම තනතුර ස්ථිරය විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

2.2 රාජ්‍ය සේවයේ පත්වීම් සම්බන්ධයෙන් වන ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10-12 දක්වා වගන්ති ද කාර්ය පටිපාටික රීති ද අදාළ වේ.

2.3 තෝරා ගනු ලබන අයදුම්කරුවන් ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, කලින් කලට රජය විසින් නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද, යටත් විය යුතුය.

(3) සාමාන්‍ය සුදුසුකම් :

3.1 ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

3.2 විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

3.3 බඳවා ගන්නා නිලධාරීන් දිවයිනේ කවර ප්‍රදේශයක වුව ද සේවය කිරීමට කැමති විය යුතුය.

3.4 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 21ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය. දැනටමත් රජයේ සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව බල නොපායි.

4. අධ්‍යාපන සුදුසුකම් :

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.

5. *බඳවා ගැනීමේ ක්‍රමය* :

5.1 ලිඛිත තරග විභාගයේ කොන්දේසි :

ලිඛිත විභාගයේ එක් එක් ප්‍රශ්න පත්‍රයකට ලකුණු 40%ක් හෝ ඊට වැඩියෙන් ලබා ගන්නා අයදුම්කරුවන් තෝරා ඔවුන් ලබාගත් මුළු ලකුණු සංඛ්‍යාවේ කුසලතා අනුපිළිවෙළට පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීම් සිදුකෙරේ.

5.2 ලිඛිත තරග විභාගයට අදාළ විෂයය නිර්දේශය :

විභාගය ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වේ.

1. අවබෝධය - කාලය පැය 01 1/2 යි - මුළු ලකුණු 100යි.
2. බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01 1/2 යි - මුළු ලකුණු 100 යි

(සාමාර්ථ්‍ය සඳහා එක් එක් විෂයයට, මුළු ලකුණුවලින් 40% ක් හෝ ඊට වැඩියෙන් අපේක්ෂකයින් විසින් ලබා ගත යුතු ය.)

01. *අවබෝධය* :

මෙම ප්‍රශ්න පත්‍රය මගින් කෙටි පාඨ ගණනාවක් අපේක්ෂකයන් වෙත දෙනු ලැබේ. ඇතැම් පාඨ දෙන්නේ එහි අර්ථය එක් වාක්‍යයකින් ප්‍රකාශ කිරීම පිණිසයි. යටින් ඉරි ඇඳි පදවලට විවරණ සැපයීම් ප්‍රශ්න ද දෙනු ලැබේ. තවත් ඇතැම් පාඨ සම්බන්ධයෙන් අපේක්ෂකයා වෙත විකල්ප ප්‍රකාශ ගණනාවක් ඉදිරිපත් කරන අතර, ඉන් එකක් මෙම පාඨයේ අන්තර්ගත කරුණුවලට වඩාත්ම ගැළපෙයි. අපේක්ෂකයන් මින් වඩාත්ම උචිත ප්‍රකාශය තෝරා ගත යුතුවේ. තවත් ඇතැම් පාඨ සම්බන්ධයෙන් අපේක්ෂකයා වෙත ප්‍රශ්න කිහිපයක් ඉදිරිපත් කරන අතර, ඒවාට නිවැරදි පිළිතුරු දීම අපේක්ෂා කෙරේ. මේ ප්‍රශ්න පිළියෙළ කරන්නේ අපේක්ෂකයා එම පාඨයන්ගේ අර්ථය වටහා ගන්නා ආකාරය පරීක්ෂා කිරීම සඳහා ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

02. *බුද්ධි පරීක්ෂණය* :

මෙම ප්‍රශ්න පත්‍රය සකස් කර ඇත්තේ අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූල තත්ත්වයත්, ඔහුගේ සිතෙහි විශ්ලේෂණ තත්ත්වයත්, ඔහුගේ තීරණ ගැනීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න වලින් යුක්ත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

5.3 විභාගය සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍ය දෙකෙන්ම පවත්වනු ලැබේ. තම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් මාධ්‍ය වෙනස් කිරීමට අපේක්ෂකයින්ට ඉඩදෙනු නොලැබේ. අපේක්ෂකයකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂා මාධ්‍යයකින් පිළිතුරු දිය යුතු ය.

5.4 ප්‍රතිඵල නිකුත් කිරීම

ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් විෂයය සඳහා ලකුණු 40%ක් හෝ ඊට වැඩියෙන් ලබාගන්නා අපේක්ෂකයින්ගේ මුළු ලකුණු කුසලතා අනුපිළිවෙළට සකස් කරන ලද ප්‍රතිඵල ලේඛණය විභාග කොමසාරිස් ජනරාල් විසින් ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත ලබාදෙනු ඇත.

එයට අමතරව එක් එක් විෂයය සඳහා ලබාගත් ලකුණු හා මුළු ලකුණු ඇතුළත් ප්‍රතිඵල ලේඛනයක් පෞද්ගලිකව අයදුම්කරුවන් වෙත ලබාදෙනු ඇත.

(6) *වැටුප් පරිමාණය (මාසික)* :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006(iv) හි MN -05-2006 A යටතේ

රු. 16,720-10x320-11x365-15x450-30,685

(7) *උසස් කිරීමේ පරිපාටිය* :

ගොවිජන සංවර්ධන නිලධාරි තනතුරේ බඳවා ගැනීම් පරිපාටිය අදාළ වේ.

8. *විභාග ගාස්තු* :

අයදුම්කරු විසින් විභාග ගාස්තු වශයෙන් ගෙවිය යුතු රු. 600.00 ක මුදල ඕනෑම ගොවිජන සේවා මධ්‍යස්ථානයකට ගෙවිය යුතු අතර, ගොවිජන සේවා මධ්‍යස්ථානය මගින් මුදල් භාර ගත් බවට ගො. සේ. ම/2(අ) කුවිතාන්සිය අයදුම්කරුට ලබාදෙනු ඇත. එම කුවිතාන්සිය අයදුම්පත්‍රයේ නම් කරන ලද ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. මතු ප්‍රයෝජනය සඳහා කුවිතාන්සියේ පිටපතක් ළඟ තබා ගැනීම සුදුසු ය. කුමන හේතුවක් නිසා හෝ එම මුදල ආපසු ගෙවනු නොලැබේ.

9. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම* :

2007.04.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව 2007.07.01 දිනට පසුව සේවයට බැඳෙන රාජ්‍ය නිලධාරින් සේවයට බැඳුනු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05 තුළ ලබා ගත යුතු ය.

10. *අත්සන සහතික කිරීම* :

අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු හෝ සමාදාන විනිශ්චයකාරවරයකු හෝ දිවුරුම් කොමසාරිවරයකු හෝ නීතිඥවරයකු හෝ ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු හෝ පොලිස් සේවයේ ගැසට් කරන ලද තනතුරක් දරන නිලධාරියකු රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියකු හෝ විසින් සහතික කළ යුතු ය. විභාගය ආරම්භ වන දිනයේ ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයයි. එසේ අත්සන සහතික කරවා නොගත් ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් කරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර නොලැබෙනු ඇත.

11. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් එහි සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපතක් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායි වනු ඇත.

12. අපේක්ෂකයකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

13. අපේක්ෂකයාගේ අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත හෝ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණක් පිළිගනු ඇත.

14. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනු ඇත.

එම්. ඒ. එස්. වීරසිංහ,
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්.

2013 දෙසැම්බර් මස 11 වැනි දින,
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 537,
කොළඹ 07

**ආදර්ශ අයදුම්පත්‍රය**

[ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ගොවිජන සංවර්ධන නිලධාරි තනතුරේ II වන ශ්‍රේණියට නිලධාරින් බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය - 2013 (2014)

Open Competitive Examination for Recruitment to Grade II of Agrarian Development Officer in the Department of Agrarian Development 2013 (2014)

ලිඛිත විභාගයට පෙනී සිටින මාධ්‍යය
සිංහල - 2
දෙමළ - 3
[ ]

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

* විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන නගරය හා නගර අංකය (ගැසට් නිවේදනයේ ඇමුණුම යටතේ උපලේඛන - 1 බලන්න.)

| නගරය | නගර අංකය |
|---|---|
| 1 | |
| 2 | |

1. (i) මුල'කුරු සමග නම (මුල'කුරු අගට යොදා ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : SUNIL, A. B. )

(ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(iii) සම්පූර්ණ නම (සිංහලෙන් හෝ දෙමළෙන්) :————.

2.ජාතික හැඳුනුම්පත් අංකය [ | | | | | | | | | ]

3. (i) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(ii) ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

4. ස්ත්‍රී/පුරුෂ භාවය :- පුරුෂ - 0 [ ] (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
ස්ත්‍රී - 1

5. (i) උපන් දිනය : වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

(ii) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

වර්ෂ [ | ] මාස [ | ] දින [ | ]

6. විවාහක/අවිවාහක බව :
අවිවාහක - 1 [ ] (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
විවාහක - 2

7. දුරකථන අංකය [ | | | | | | | | | ]

8. (i) ලබා ඇති උපාධිය හා වර්ෂය :————.
(ii) උපාධිය ලබා ඇති විශ්වවිද්‍යාලය :————.
(iii) සාමාර්ථ්‍යයේ ස්වභාවය සාමාන්‍ය/ගෞරව I පන්තිය/II පන්තිය (ඉහළ/පහළ)
විශේෂ/ගෞරව I පන්තිය/II පන්තිය (ඉහළ/පහළ)
(iv) අදාළ විෂයයන් :————.

9. ගොවිජන සේවා මධ්‍යස්ථානය මගින් නිකුත් කරන ලද කුවිතාන්සි අංකය, දිනය හා ගොවිජන සේවා මධ්‍යස්ථානයේ නම :————.

කුවිතාන්සිය මෙම කොටුවෙහි නොගැලවෙන සේ ඇලවිය යුතු ය.

10. *අයදුම්කරුගේ ප්‍රකාශය :*

ඉහත සඳහන් තොරතුරු මා දන්නා පරිදි සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. තව ද, මෙහි ඇතුළත් කිසියම් තොරතුරක් අසත්‍ය හා සාවද්‍ය බව සොයා ගතහොත්, එම සොයා ගැනීම තෝරා ගැනීමට පෙර සිදුවුවහොත් මා නුසුදුස්සකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසුව සොයා ගනු ලැබුවහොත් කිසිදු වන්දියක් නොමැතිව සේවයෙන් පහ කිරීමකට ලක්වන බව ද දනිමි. තව ද විභාග කොමසාරිස් ජනරාල් විසින්, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

11. *අත්සන සහතික කිරීම :*

මෙහි අත්සන් කරන ලද ………… හි පදිංචි ………… මයා/මිය/මෙය මම පෞද්ගලිකව හඳුනන බවත් ඔහුගේ/ඇයගේ අත්සන ………… දින මා ඉදිරිපිට දී තැබූ බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන්නාගේ :

නම :————.

තනතුර :————.

ලිපිනය :————.

දිනය :————.

12. රාජ්‍ය සේවයේ සිටින අයදුම්කරුවන් සඳහා පමණි.

මෙම ඉල්ලුම්කරු වන ............ මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ............ වශයෙන් ස්ථිර/තාවකාලික/අනියම් සේවකයකු/සේවිකාවක ලෙස සේවය කරන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බවත්, ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

උපලේඛන - 1

*විභාග මධ්‍යස්ථාන පිහිටවිය යුතු නගර අංක පහත දැක්වෙන ලැයිස්තුවෙන් තෝරා ගන්න.*

| *පළාත* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|
| බස්නාහිර | කොළඹ | 01 |
| | ගම්පහ | 02 |
| | කළුතර | 03 |
| මධ්‍යම | මහනුවර | 04 |
| | මාතලේ | 05 |
| | නුවරඑළිය | 06 |
| දකුණු | ගාල්ල | 07 |
| | මාතර | 08 |
| | හම්බන්තොට | 09 |
| උතුරු | යාපනය | 10 |
| | මන්නාරම | 11 |
| | වව්නියාව | 12 |
| | මුලතිව් | 13 |
| | කිලිනොච්චිය | 14 |
| නැගෙනහිර | මඩකලපුව | 15 |
| | අම්පාර | 16 |
| | ත්‍රිකුණාමලය | 17 |
| වයඹ | කුරුණෑගල | 18 |
| | පුත්තලම | 19 |
| උතුරු මැද | අනුරාධපුරය | 20 |
| | පොලොන්නරුව | 21 |
| ඌව | බදුල්ල | 22 |
| | මොනරාගල | 23 |
| සබරගමුව | රත්නපුර | 24 |
| | කෑගල්ල | 25 |

12-1184

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

විදේශ කටයුතු අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා විදේශ සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2013 (2014)**

ශ්‍රී ලංකා විදේශ සේවයේ III වන ශ්‍රේණියේ (මෙහි මින් ඉදිරියට 'සේවය' යනුවෙන් සඳහන් වන) පවතින පුරප්පාඩු 25ක් පිරවීම සඳහා අංක 02හි සඳහන් සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය.*— නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණකර ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව, ලිඛිත විභාගයේ දී හා සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් මුළු ලකුණුවල එකතුව මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සුදුසු අයදුම්කරුවන් බඳවා ගනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම් :*

(i) අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :

* ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා සිටිය යුතු ය.

*නැතහොත්*

* ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද විදේශීය විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා සිටිය යුතු ය. (මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ලිඛිත සාක්ෂි සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරු විසින් ඉදිරිපත් කළ යුතුවේ).

(ii) කායික සුදුසුකම් :
සෑම අපේක්ෂකයකුම මෙරට හෝ ලෝකයේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

(iii) වෙනත් :

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය;
(ආ) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය;
(ඇ) අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට මෙම තනතුර සඳහා බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :*

(i) මෙම සේවය සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන්, රාජ්‍ය සේවයේ පත්වීම් කෙරෙහි බලපාන පොදු කොන්දේසි මත, වසර 2001 ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථා මාලාවට මෙතෙක් කර ඇත්තා වූ හෝ මින් ඉදිරියට කරනු ලබන්නා වූ හෝ සංශෝධන කිසිවක් වෙතොත් ඒවා ද සමඟ එකී ව්‍යවස්ථා මාලාවේ දක්වා ඇති වගන්ති හා කොන්දේසිවලට යටත් විය යුතු ය.

(ii) මෙම තනතුරු ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

(iii) පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් ය. විදේශ සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(iv) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත සේවාවට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව අදාළ ප්‍රවීණතාවය ලබාගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතු ය.

(v) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

04. *වයස් සීමාව* :

අයදුම්කරුවන්, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 22ට එළඹ සිටිය යුතු අතර අවුරුදු 32ට නොඑළඹ සිටිය යුතු ය. රාජ්‍ය සේවයේ නිරත අයදුම්කරුවකු නම්, ඔහු/ඇය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 40ට නොඑළඹ සිටිය යුතු අතර, සතුටුදායක සේවා වාර්තාවක් ද ලබා සිටිය යුතු ය.

*සටහන*.—

(i) ඉහත 04 ඡේදයේ ප්‍රකාශිත අරමුණ වෙනුවෙන් රාජ්‍ය සේවයේ නිරත අයදුම්කරුවකු යනු (ආයතන සංග්‍රහයේ I වැනි පරිච්ඡේදයේ නිර්වචනයකර ඇති පරිදි) අයදුම්පත් භාර ගැනීම අවසන් කරන දිනට සේවයේ ස්ථිර කරන ලද රාජ්‍ය සේවයේ නිලධාරියකු හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියකු වේ.

(ii) අයදුම්පත් භාර ගැනීම අවසන් කරන දිනට පූර්වාසන්න වූ පස් අවුරුදු කාලය තුළදී හෝ සේවයේ යෙදී සිටි කාලසීමාව ඊට අඩුනම් එම මුළු කාල සීමාවේදී හෝ සතුටුදායක සේවා වාර්තාවක් ලබා තිබුණි නම් මිස නැත්නම් දැනට රාජ්‍ය සේවයේ නියුතු කිසිදු නිලධාරියකු මෙම විභාගයට පෙනී සිටීම සඳහා යෝග්‍ය නොවනු ඇත.

(iii) රාජ්‍ය සේවයේ නිලධාරියකු, සතුටුදායක සේවා වාර්තා ලබා ඇති සේ සලකනු ලබන්නේ ඔහු/ඇය අයදුම්පත් භාර ගැනීම අවසන් කරන දිනට පෙරාතුව පස් අවුරුදු කාලසීමාව තුළ හෝ තත් ආයතනයේ මුළු සේවා කාලය ඊට අඩු නම් එම මුළු කාලය තුළ හෝ යෙදුණු සියලු වැටුප් වර්ධක ද උපයාගෙන, එකී කාලසීමාව තුළ කරන ලද යම් වරදක් සම්බන්ධයෙන් (අවවාද කිරීමක් හැර) කිසිදු අන්දමක දඬුවමක් නොලැබ සිටියේ නම් පමණකි.

(iv) රාජ්‍ය සේවයේ නියුක්ත අයැදුම්කරුවන් තම අයදුම්පත් එවිය යුත්තේ තම තමන්ගේ අදාළ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මගිනි.

05. *වැටුප් පරිමාණය* :

මෙම සේවයට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 හි එස්එල්-1-2006 වැටුප් බණ්ඩය අදාළ වේ. එම වැටුප් බණ්ඩයට හිමි වැටුප් පරිමාණය පහත පරිදි වේ.

රු. 22,935-10 x 645-8 x 790-17 x 1050 = රු. 53,555 (මාසික)

06. *ලිඛිත පරීක්ෂණය* :

(i) රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් 2014 අප්‍රේල් මස කොළඹ දී පවත්වනු ලැබේ. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ii) විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පමණක් පැවැත්වේ.

(iii) අයදුම්කරුවකුට ඉහත දක්වා ඇති ඕනෑම එක් භාෂා මාධ්‍යයක් ඉල්ලුම් කළ හැකි අතර, විභාගයට නියමිත සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා ඉල්ලුම් කරන ලද එම භාෂා මාධ්‍යයෙන්ම පෙනී සිටිය යුතු ය. ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(iv) ලිඛිත විභාගය පහත සඳහන් විෂයයන් පිළිබඳ ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ.

| *විෂය අංකය* | *විෂයය* | *නියමිත කාලය* | *ලකුණු* |
|---|---|---|---|
| 01 | පොදු ප්‍රශ්න පත්‍රය | පැය 03 | 100 |
| 02 | ලෝක තතු I | පැය 03 | 100 |
| 03 | ලෝක තතු II | පැය 03 | 100 |
| 04 | රචනය | පැය 03 | 100 |
| 05 | සාරාංශ ලිවීම | පැය 01 | 100 |
| 06 | අභියෝග්‍යතා පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම (බහුවරණ ප්‍රශ්න පත්‍රය) | පැය 01 යි විනාඩි 40 | 100 |

**ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය** :

(01) *පොදු ප්‍රශ්න පත්‍රය*.—ශ්‍රී ලංකාවේ දේශපාලන, සමාජයීය, සංස්කෘතික හා ආර්ථික පරිසරය පිළිබඳවත්, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වැදගත් වන වත්මන් කරුණු පිළිබඳව සහ තාක්ෂණික හා විද්‍යාත්මක සංවර්ධනය පිළිබඳවත් අයැදුම්කරු ලබා ඇති දැනුම පරීක්‍ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලැබේ.

(02) *ලෝක තතු I* - සමස්ත ලෝකයේ සාමය, ආරක්‍ෂාව හා සංවර්ධනය පිළිබඳ ප්‍රවණතා සහ ඒවා ශ්‍රී ලංකාව කෙරෙහි බලපාන ආකාරය විග්‍රහ කිරීමෙහිලා අයැදුම්කරු සතු හැකියාව නිශ්චය කිරීම සඳහා ලෝකයේ දේශපාලන සිදුවීම්, එක්සත් ජාතීන්ගේ සංවිධාන හා වෙනත් ජාත්‍යන්තර සංවිධාන හා ගැටුම් තත්ත්වයන් හා නොයෙකුත් ජාතික හා ජාත්‍යන්තර ව්‍යාපාරවල දියුණුව අලලා වූ ප්‍රශ්නවලින් මේ ප්‍රශ්න පත්‍රය සමන්විත වේ.

(03) *ලෝක තතු II* - ජාත්‍යන්තර සංවිධානවල කාර්යභාරය, කලාපීය ආර්ථික කණ්ඩායම්වල බලපෑම, පරිසරය හා ධරණීය සංවර්ධනය වැනි කරුණුවලට අදාල ප්‍රශ්න ද ඇතුළත්ව වෙළඳාම හා ආර්ථික සංවර්ධනය පිළිබඳ මෑත කාලීන ප්‍රවණතා හා ඒවා ශ්‍රී ලංකාවට අදාළ වන ආකාරය පිළිබඳ ප්‍රශ්න මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු වේ.

(04) *රචනය* - නියමිත විෂයයක් හෝ කිහිපයක් හෝ යටතේ රචනය ලිවිය යුතු ය. මෙම මාතෘකා අධ්‍යයන ක්ෂේත්‍රයේ කිසිම විෂයකට සම්බන්ධ නොවන අතර, එය සකස් කරනු ලබන්නේ අපේක්ෂකයා/අපේක්ෂිකාව ගේ සාමාන්‍ය දැනීම සහ බුද්ධියත්, සිතීමේ හා අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාවත් පරීක්ෂා කිරීම පිණිසය. මාතෘකාව යටතේ කරුණු දැක්වීමෙහිලා අයදුම්කරුගේ

කල්පනා ශක්තිය හා ප්‍රතිභාව මෙන්ම භාෂා ශෛලිය හා ඉදිරිපත් කිරීමේ හැකියාව නිශ්චය කිරීම සඳහා රචනය උපයෝගි කරගනු ලැබේ. එය කියවිය හැකි පරිදි පැහැදිලි අකුරෙන් ලිවිය යුතු ය.

*සටහන* - කරුණට අදාළවන පරිදි පැහැදිලිව ලිවීමේ වැදගත්කම කෙරෙහි අපේක්‍ෂක/අපේක්ෂිකාවන්ගේ අවධානය යොමු කරනු ලැබේ. විෂයය මනා පරීක්‍ෂණයට භාජනය කිරීම, විමසා බැලීමේ ශක්තිය, ලිවීමේ තත්ත්වය, තම අදහස් කෙටියෙන් පැහැදිලිව ප්‍රකාශ කිරීමේ ශක්තිය සඳහා ලකුණු හිමිවේ.

(05) *සාරාංශ ලිවීම.*—දී ඇති ඡේදයක/ඡේදයන්හි අර්ථය අවබෝධ කරගෙන එය සිත් ඇදගන්නා ආකාරයෙන් පැහැදිලිව හා සංක්‍ෂිප්තව ඉදිරිපත් කිරීමෙහිලා අයදුම්කරුගේ හැකියාව පරීක්‍ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කොට ඇත.

(06) *අභියෝග්‍යතා පරීක්‍ෂණය හා සාමාන්‍ය දැනීම.*—කොටස් දෙකකින් යුක්ත මෙම ප්‍රශ්න පත්‍රය වාස්තවික ආකාරයේ ප්‍රශ්නවලින් සමන්විත වන අතර, මතු සඳහන් කාණ්ඩ වලින් යුක්ත වේ. එහි එක් කොටසකට ලකුණු පනහ (50) බැගින් ලැබේ.

(අ) *අභියෝග්‍යතා පරීක්‍ෂණය* : අයදුම්කරුගේ තර්කානුකූල හේතු දැක්වීමේ හා විස්තර විභාග කිරීමේ හැකියාව තක්සේරු කිරීම සඳහා.

(ආ) *සාමාන්‍ය දැනීම හා වත්මන් තතු* : දේශීය වශයෙන් මෙන්ම ජාත්‍යන්තර වශයෙන් දේශපාලන, ආර්ථික හා සමාජ සංස්කෘතික ක්ෂේත්‍රවල වත්මන් සිදුවීම් පිළිබඳ අයදුම්කරුගේ දැනුම පරීක්‍ෂා කිරීම සඳහා.

07. *සම්මුඛ පරීක්‍ෂණය* :

(i) සම්මුඛ පරීක්‍ෂණය සඳහා කැඳවනු ලබන්නේ ලිඛිත පරීක්‍ෂණයේදී එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා අවම වශයෙන් 40%ක් බැගින් සහ මුළු ලකුණු 300කට අඩු නොවන පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිගමනය කරන සීඳලුම් ඉමට හෝ ඉන් ඉහළට මුළු ලකුණු ලබාගත් අයදුම්කරුවන් පමණි. එහෙත් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව මෙන් පස් ගුණයකට නොවැඩි වනු ඇත.

(ii) සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු 100 ක් හිමි වේ. කිසිම හේතුවක් නිසාවත් අවම ලකුණු සංඛ්‍යාව අඩු කරනු නොලැබේ.

(iii) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් අපේක්ෂක/අපේක්ෂිකාවන් සම්බන්ධයෙන් වැදගත් වන කරුණු සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ඇත. අපේක්ෂකයා/අපේක්ෂිකාව බඳවා ගනු ලබන සේවයට ඔහුගේ/ඇයගේ යෝග්‍යතාව මැන බැලීම සම්මුඛ පරීක්ෂණයේ අරමුණ වේ. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය තම නිගමනයට එළැඹීමේදී අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ බුද්ධිය සහ මානසික උත්සුකතාව කෙරෙහිත්, පෞරුෂත්වය කෙරෙහිත් විශේෂයෙන් සැලකිල්ලක් දක්වනු ලැබේ. අයදුම්කරුගේ අනිකුත් භාෂා ප්‍රවීණතාවන්, උසස් අධ්‍යාපන සුදුසුකම් හා පරිගණක හැකියාව මෙම සම්මුඛ පරීක්ෂණයේදී ඇගයීමට ලක්කරනු ඇත.

(iv) සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදෙන ආකාරය පහත පරිදි වේ.

| *සම්මුඛ පරීක්‍ෂණයේදී ලකුණු ප්‍රදානය කරනු ලබන විෂයය ශීර්ෂ* | *කල්පිත ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|
| 01. *අතිරේක අධ්‍යාපනික සුදුසුකම්* : පිළිගත් විශ්වවිද්‍යාලයක් විසින් ලබාදෙන උපාධියක් | | 20 |
| (අ) පළමු පන්තියේ සාමාර්ථයක් සහිත උපාධියක් | 20 | |
| (ආ) දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සහිත උපාධියක් | 15 | |
| (ඇ) දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සහිත උපාධියක් | 10 | |
| 02. වෘත්තීය සුදුසුකම් : | | 20 |
| (අ) පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රයේ ශාස්ත්‍රපති උපාධිය | 20 | |
| (ආ) පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් (වසරකට නොඅඩු) | 15 | |
| (ඇ) පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රයේ ඩිප්ලෝමා පාඨමාලාවක් (මාස 06 කට නොඅඩු/පැය 720 කට නොඅඩු) | 12 | |
| (ඈ) පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රයේ ඩිප්ලෝමා පාඨමාලාවක් (මාස 03 කට නොඅඩු/පැය 360 කට නොඅඩු) එක් පාඨමාලාවක් සඳහා ලකුණු 05 බැගින් | 10 | |
| 03. ඉංග්‍රීසි භාෂාවේ ප්‍රවීණතාව : | | 15 |
| (අ) ඉංග්‍රීසි විශේෂවේදී උපාධියක් | 10 | |
| (ආ) ඉංග්‍රීසි භාෂාව උපාධියේ ප්‍රධාන විෂයයක් ලෙස (සාමාන්‍ය කලා උපාධිය යටතේ) | 08 | |
| (ඇ) ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලබාගත් උපාධියක් | 08 | |
| (ඈ) පිළිගත් විශ්වවිද්‍යාලයකින්, කාර්මික විද්‍යාලයකින් හෝ රජයේ ලියාපදිංචි අධ්‍යාපන ආයතනයකින් ලබා ගත් ඩිප්ලෝමා පාඨමාලාවක් (කාල සීමාව වසරකට වඩා වැඩි විය යුතුය) *හෝ* TOEFL, (TOEFL-iBT Score 79, TOEFL-CBT Score 213, TOEFL-PBT Score 550 or above) හෝ IELTS (Score 6.0 or above) වැනි සුදුසුකමක් | 06 | |
| (ඉ) ඉංග්‍රීසි භාෂාව අ.පො.ස. උසස් පෙළ විභාගයේ ප්‍රධාන විෂයයක් ලෙස (දේශීය හෝ ලන්ඩන් විෂය නිර්දේශවලට අනුව) | | |
| විශිෂ්ට සාමාර්ථය | 05 | |
| සම්මාන සාමාර්ථය | 04 | |
| (ඊ) කථන ඉංග්‍රීසි භාෂාවේ ප්‍රවීණතාව | 05 | |

| සම්මුඛ පරීක්‍ෂණයේදී ලකුණු ප්‍රදානය කරනු ලබන විෂයය ශීර්ෂ | කල්පිත ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|
| 04. *විදේශ භාෂා ප්‍රවීණතාව :* අ.පො.ස. සාමාන්‍ය පෙළ මට්ටමේදී හෝ ඊට ඉහළ මට්ටමකදී ඉංග්‍රීසි හැර වෙනත් විදේශ භාෂාවක් සම්බන්ධයෙන් ලබාගත් ප්‍රවීණතාව, හෝ රජයේ ලියාපදිංචි අධ්‍යාපන ආයතනයකින් ලබාගත් සහතික පත්‍ර පාඨමාලාවක් හෝ ඊට ඉහළ මට්ටමේ සුදුසුකමක් (මාස 03 කට නොඅඩු/පැය 360 කට නොඅඩු) එක් භාෂාවකට ලකුණු 05 ක් බැගින් (උපරිම වශයෙන් භාෂා 3 ක්) | | 15 |
| 05. *පරිගණක ප්‍රවීණතාව :* | | 10 |
| (අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් | 10 | |
| (ආ) පිළිගත් විශ්වවිද්‍යාලයකින්, කාර්මික විද්‍යාලයකින් හෝ රජයේ ලියාපදිංචි අධ්‍යාපන ආයතනයකින් ලබාගත් ඩිප්ලෝමා පාඨමාලාවක් (අවුරුද්දකට නොඅඩු) | 08 | |
| (ඇ) රජයේ ලියාපදිංචි අධ්‍යාපන ආයතනයකින් ලබාගත් සහතික පත්‍ර පාඨමාලාවක් (මාස 06 කට නොඅඩු/ පැය 720 කට නොඅඩු) (තොරතුරු තාක්ෂණ උපාධිය මූලික සුදුසුකම වන්නේ නම්, මෙම ශීර්ෂය යටතේ තොරතුරු තාක්ෂණ උපාධියට ලකුණු ලබාදෙනු නොලැබේ.) | 05 | |
| 06. *රාජ්‍ය භාෂා ප්‍රවීණතාව :* අ.පො.ස. සාමාන්‍ය පෙළ මට්ටමේදී හෝ ඊට ඉහළ මට්ටමකදී රාජ්‍ය භාෂාවල හෝ සන්ධාන භාෂාවෙහි ලබාගත් ප්‍රවීණතාව, හෝ රජයේ ලියාපදිංචි අධ්‍යාපන ආයතනයකින් ලබාගත් සහතික පත්‍ර පාඨමාලාවක් හෝ ඊට ඉහළ මට්ටමේ සුදුසුකමක් (මාස 3 කට නොඅඩු/ පැය 360 කට නොඅඩු) එක් භාෂාවකට ලකුණු 05 ක් බැගින් (උපරිම වශයෙන් භාෂා 2 ක්) | | 10 |
| 07. පෞරුෂත්වය, ඉදිරිපත් කිරීම සහ විශේෂ කුසලතා | | 10 |
| එකතුව | | 100 |

08. *අයදුම් කරන ආකාරය :*

(i) අයදුම්පත්‍ර, ආදර්ශ ආකෘතියට අනුව, ඒ 4 පත්‍රයක සකස් කොට ඉදිරිපත් කළ යුතු ය. ඒ 4 පත්‍රයේ දෙපසම පාවිච්චි කළ යුතු අතර, අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 07 දක්වා පළමු පිටුවට ද, ඉතිරිය දෙවන හා තෙවන පිටුවලට ද, ඇතුළත්වන සේ අයදුම්පත සකස් කළ යුතු ය. අයදුම්පත අපේක්ෂකයා/අපේක්ෂිකාවගේ අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතු ය. අයදුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම, සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය.

ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඔබ විසින් ඉදිරිපත් කරන අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ii) අපේක්ෂකයා/අපේක්ෂිකාව විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන් අයදුම්පත පිළියෙල විය යුතු ය.

(iii) ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය 2014 ජනවාරි මස 31 දින වේ. සම්පූර්ණ කරන ලද අයදුම්පත් "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් බහා එවන කවරයේ වමත්පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා විදේශ සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2013 (2014)" යනුවෙන් පැහැදිලිව සලකුණු කර තිබිය යුතුයි. ලියුම් කවරයේ වමත්පස ඉහළ කෙළවරේ (සෙ. මී. 2 x සෙ. මී. 2) ප්‍රමාණයේ කොටුවක් තුළ ඉංග්‍රීසි "S" අක්ෂරය සඳහන් කළ යුතු ය.

(iv) සෑම අතින්ම සම්පූර්ණ නොවූ අයදුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත. තැපෑලේදී යම් අයදුම්පතක් නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ ඉදිරිපත් කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ.

(v) අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ. නියමිත පරිදි විභාග ඉල්ලුම්පත්‍ර යොමු කරන ලද සියලුම අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් විභාග දෙපාර්තමේන්තුව විසින් පළකරනු ඇත. එම නිවේදනය පළවී දින 02 ක් හෝ 03 ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලද අයදුම්කරුවකු වේ නම්, නිවේදනයේ සඳහන් දුරකථන අංක ඔස්සේ ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්විය යුතු ය. එහිදී, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කළ යුතු අතර, එසේ විමසන අවස්ථාවේ අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, මුදල් ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපත හා ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය අතැතිව සිටීම වැදගත් වේ. කොළඹින් බැහැර අයදුම්කරුවෙකු නම්, ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබාගැනීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් හා ඉහත දක්වා ඇති තොරතුරු ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ෆැක්ස්

මගින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින් විමසා සිටීම ද ප්‍රතිඵලදායී වනු ඇත.

09. *විභාගයට ප්‍රවේශය* :-

(i) විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙකුම ප්‍රවේශ පත්‍රයේ පසුපිටෙහි දක්වා ඇති උපදෙස් අනුව ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගත යුතුය. විභාගයට පෙනී සිටින පළමු අවස්ථාවේදීම එසේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඔබට නියමිත විභාග ශාලාවේ ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු යි. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයෙකුට/අපේක්ෂිකාවකට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

(ii) අයදුම්කරුවකු විභාගයට පෙනී සිටිය යුත්තේ ඔහුට/ඇයට නියම කරන ලද විභාග ශාලාවේ දී ය. සෑම අපේක්ෂකයෙකු/අපේක්ෂාකවකම විභාගයට පෙනී සිටින පළමු වන දිනයේදී ම විභාගයට පෙනී සිටීමට පෙර, තම ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපතිට භාර දිය යුතු යි. සියලුම අයදුම්කරුවන් විසින් පිළිපැදිය යුතු නීති මාලාවක් මෙම ගැසට් පත්‍රයේ පළ වේ.

*සටහන.*— අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය, *ගැසට් නිවේදනයෙන්* අපේක්ෂිත සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතු ය.

10. *විභාග ගාස්තුව* :

විභාග ගාස්තුව රු. 1000 ක් වන අතර, අයදුම්පත් භාර ගැනීම අවසන් කරන දිනයට පෙර, මේ ගාස්තුව ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර වනු පිණිස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවිය යුතු වේ. විභාග ගාස්තු ගෙවා අයදුම්කරුගේ නමින් ලබාගන්නා කුවිතාන්සිය එහි දාරයකින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. අදාළ කුවිතාන්සියේ ඡායාපිටපතක් අයදුම්කරු විසින් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.

*සටහන.*—කවර හේතුවක් නිසා වුව ද විභාගයෙන් ඉවත් වන හෝ, නොපැමිණ සිටින හෝ, විභාගයට පෙනී සිටීමෙන් පසු සුදුසුකම් නැත්තකු බවට දක්නට ලැබෙන හෝ යම් අපෙක්ෂකයෙකුට විභාග ගාස්තුව මුළුමණින්ම හෝ ඉන් කොටසක් හෝ ආපසු ලබා ගැනීමට හිමිකමක් නැත.

11. *අයදුම්කරුගේ අනන්‍යතාව* :

අයදුම්කරු තමන් පෙනී සිටින එක් එක් විෂයයක් පාසා විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ඔහුගේ/ඇයගේ අනන්‍යතාව ඔප්පු කළ යුතුවේ. මේ සඳහා මතු සඳහන් ලියවිලිවලින් කවරක් හෝ පිළිගනු ලැබේ.

(*අ*) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;
(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

12. *ප්‍රතිඵල නිකුත් කිරීම* :

විභාගයේ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් අනතුරුව අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි සිදු කෙරේ.

13. *සාවද්‍ය තොරතුරු සැපයීම* :

ඔබ විසින් එවන ලද අයදුම්පතේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

14. මෙම ගැසට් නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි වන්නේ ය. එමෙන්ම පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම හෝ පුරප්පාඩුවලින් කොටසක් පිරවීම පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

15. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

කරුණාතිලක අමුණුගම,
ලේකම්.

2013 දෙසැම්බර් මස 11 දින,
විදේශ කටයුතු අමාත්‍යාංශය,
ජනරජ ගොඩනැගිල්ල,
කොළඹ 01.

ආදර්ශ අයදුම්පත

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

විදේශ කටයුතු අමාත්‍යාංශය

ශ්‍රී ලංකා විදේශ සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය 2013 (2014)

Open Competitive Examination for Recruitment to Grade III of The Sri Lanka Foreign Service - 2013 (2014)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ අංකය කොටුව තුළ ලියන්න).

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

01. (i) (*අ*) මුල්'කුරු අගට යොදා මුල්'කුරු සමග නම (ඉංග්‍රීසි) කැපිටල් අකුරෙන් : උදා : SUMANASIRI, E. D. C. B. A. :———— ———.

(*ආ*) මුල්'කුරු අගට යොදා මුල්'කුරු සමග නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

(ii) (*අ*) මුල්'කුරුවලින් කියවෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(*ආ*) මුල්'කුරුවලින් කියවෙන නම් (සිංහලෙන්/දෙමළෙන්) :— ———.

02. ලිපිනය :

(i) පදිංචි ස්ථානය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(විභාග ප්‍රවේශ පත්‍රය තැපැල් කරනු ලබන්නේ මෙම ලිපිනයටය)

(ii) කාර්යාලයීය :————.

(iii) දුරකථන අංකය : කාර්යාලයීය :————.
(පෞද්ගලික) :————.

03. ස්ත්‍රී/පුරුෂභාවය :

පුරුෂ - 0
ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

04. ජාතික හැඳුනුම්පත් අංකය

05. (i) උපන් දිනය :

අවුරුද්ද මාසය දිනය

(ii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :

අවුරුදු මාස දින

06. ජනවර්ගය :
(අදාළ අංකය කොටුව තුළ යොදන්න.)
(සිංහල -1, දෙමළ -2, ඉන්දියානු දෙමළ - 3, මුස්ලිම් -4, වෙනත් -5)

07. සිවිල් තත්වය :
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
අවිවාහක - 1
විවාහක - 2

08. ශ්‍රී ලංකා විදේශ සේවයට පත්වීම සඳහා මීට පෙර යම් විභාගයකට පෙනී සිට ඇත්නම් අවුරුද්ද/අවුරුදු සඳහන් කරන්න.
(අ) ————.
(ආ) ————.
(ඇ) ————.

09. ඔබ රාජ්‍ය සේවයේ යම් තනතුරක් දරන උපාධිධාරියෙක් නම් එම තනතුරේ නම සඳහන් කරන්න. :————.

10. උපාධිය පිළිබඳ විස්තර සහ එය පිරිනැමූ දිනය : (මෙහිලා සුදුසුකම් තිබේදැයි දැනගනු පිණිස මේ දැන්වීමේ 2 (i) ඡේදය කියවා බලන්න.)

(i) විශ්ව විද්‍යාලය/ආයතනය :————.
(ii) උපාධියේ නම :————.
(iii) උපාධිය පිරිනැමූ දිනය:————.
(iv) සාමාන්‍ය/විශේෂ :————.
(v) විෂයය :————.
(vi) පන්තිය :————.

11. අදාළ වන වෙනත් අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් ඇත්නම් (පශ්චාත් උපාධි/ඩිප්ලෝමා/විදේශ භාෂා ප්‍රවීණතාව ආදිය) සඳහන් කරන්න. :————.

12. මගේ උපරිම දැනීම හා විශ්වාසය අනුව මෙහි සඳහන් තොරතුරු සැබෑ බවත් විභාග ගාස්තු ගෙවා ලබාගත් ............... දින හා අංක ............... දරන කුවිතාන්සිය මීට අමුණා ඇති බවත් මෙයින් ප්‍රකාශ කරමි. විභාගයට බලපවත්නා නියමයන්ටත් විභාගයේ නීතිරීති අනුව මා නුසුදුසු බව දක්නට ලැබුනහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන අතරතුරේදී හෝ විභාගයෙන් පසු හෝ මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයන් වෙතොත් ඊටත් අවනත වීමට ද මම එකඟ වෙමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බවද ප්‍රකාශ කරමි.

| විභාග ගාස්තු ගෙවා ලබාගත් කුවිතාන්සිය මෙහි අලවන්න.<br>(කුවිතාන්සියේ ඡායා පිටපතක් ලඟ තබාගන්න.) |
|---|

————.
අයැදුම්කරුගේ අත්සන.

දිනය :————.

*13. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :*

(දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/නියුතු අපේක්ෂකයකු/ අපේක්ෂිකාවක් නම් පමණි.)

............... මහතා/මෙනෙවිය/මිය ............... දිනට පූර්වාසන්න පස් අවුරුදු කාලසීමාව තුළ (අ) තමාට හිමි සියලු වැටුප් වර්ධක උපයා ඇති බවත්, (ආ) අවවාද කිරීමක් හැර කිසිදු විනය දඬුවමකට ලක්වී නැති බවත් සොයා බලා සැකහැර දැනගතිමි.

මේ අයදුම්පතේ සපයා ඇති තොරතුරු නිවැරදි බව ද නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බව ද එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

මේ නිලධාරියා/නිලධාරිණිය තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් වහාම මුදාහළ හැකි වේ.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන සහ පදවිය.

දිනය :————.

12-1117

**යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය**

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

**තාක්ෂණ විද්‍යාලයන්හි පැවැත්වෙන ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 5 (NVQ Level 5) ඩිප්ලෝමා මට්ටමේ පාඨමාලා සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම - 2014**

මෙම නිවේදනයේ සඳහන් තාක්ෂණ විද්‍යාලවල පැවැත්වෙන පාඨමාලා සඳහා සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ. අයැදුම්කරුවන් අතුරින් ඔවුන්ගේ සුදුසුකම් හා කුසලතාවයන් සැලකිල්ලට ගෙන පාඨමාලා සඳහා අවශ්‍ය ප්‍රමාණයට සිසුන් බඳවා ගනු ලැබේ.

02. දැන්වීමේ දක්වා ඇති "ආදර්ශ අයදුම්පත්‍රයට" අනුව 13" x 8" ප්‍රමාණයේ කඩදාසියක අදාළ අයදුම්පත්, අයදුම්කරුවන් විසින්ම සකස් කර ගත යුතුවේ. සෑම අයදුම්පත්‍රයක්ම, ආදර්ශ අයදුම්පතෙහි 14 වැනි අංකය යටතේ සඳහන් වන පරිදි වලංගු රු. 10 ක මුද්දරයක් අලවා තමන්ගේ සුපුරුදු අත්සන යොදා අවලංගු කළ යුතු ය. නිසිලෙස සම්පූර්ණ කරන ලද අයැදුම්පත් 2014.01.28 වැනි දිනට හෝ ඊට පෙර අදාළ තාක්ෂණ විද්‍යාලයේ අධ්‍යක්ෂ වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

03. කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන පාඨමාලාවේ නම හා සංකේත අංකය යොදන්න.

04. නියමිත දිනට පසුව ලැබෙන අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. අර්ධ කාල/සන්ධ්‍යා කාල පාඨමාලා සඳහා අධ්‍යයන වර්ෂයකට රු. 2,000 ක් අයකරනු ලැබේ.

06. සියළුම පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.

07. *පාඨමාලාවල ස්වභාවය.*— ඒ ඒ පාඨමාලා සඳහා සුදුසුකම් හා පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල යනාදිය මෙම දැන්වීමේ දක්වා ඇති පාඨමාලා පිළිබඳ ලේඛනයෙහි සඳහන් කර ඇති අතර, සියලුම අයැදුම්කරුවන්ගේ අවධානය එයට යොමු කරවනු ලැබේ. ඒ ඒ තාක්ෂණ විද්‍යාලයේ ලිපිනය තාක්ෂණ විද්‍යාල ලැයිස්තුවේ සඳහන් වේ.

08. මෙම තාක්ෂණ විද්‍යාලයන්හි පාඨමාලා හැදෑරීමට ඉල්ලුම් කරන සෑම ඉල්ලුම්කරුවකු/ඉල්ලුම්කාරියකම—

(i) මනා චරිතයකින් යුක්ත විය යුතු ය.
(ii) ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය.
(iii) ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කරන අවස්ථාවේ දී ඇතුළත්වීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

09. සුදුස්සන් තෝරාගනු ලබන්නේ අභියෝග්‍යතා පරීක්ෂණයක හා සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මතය.

10. ලිපිලේඛන කිසිවක් හෝ ඒවායේ පිටපත් හෝ ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් නොකළ යුතු ය. තේරීම් පරීක්ෂණයේ දී අවශ්‍ය හා පිළිගත හැකි ලිපි ලේඛන ඉදිරිපත් කර යෝග්‍යතාවය ඔප්පු කිරීමට නොහැකි වන අයදුම්කරුවන් නුසුදුස්සන් වනු ඇත.

11. (i) පූර්ණ කාලීන දිවා පාඨමාලා හදාරණ සිසුන් සඳහා තම පවුලේ ආර්ථික තත්ත්වය මත විද්‍යාලයේ පන්තිවලට සහභාගී වන සෑම දිනකටම රු. 50 ක දීමනාවක්, මසකට රු. 1,000 ක උපරිමයකට යටත්ව ගෙවනු ලැබේ.

(ii) පූර්ණ කාලීන දිවා පාඨමාලා හදාරණ සිසුන් අතරින් තෝරාගත් අඩු ආදායම්ලාභී ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා රු. 2,500 බැගින් වූ වාර්ෂික ශිෂ්‍යාධාරයක් ගෙවනු ලැබේ.

12. සිය ලිපි ලේඛනවල සත්‍යතාවය පිළිබඳව ඉල්ලුම්කරු සම්පූර්ණයෙන්ම වගකිව යුතු ය. වංචනික හෝ වෙනස්කිරීම් සහිත ලිපිලේඛන ඉදිරිපත් කරන හෝ සඳහන් කරුණු සනාථ වන සේ ලිපි ලේඛන ඉදිරිපත් නොකරන ඉල්ලුම්කරුවන්ට විරුද්ධව තදින් ක්‍රියාකරනු ලැබේ.

13. මෙම ගැසට් පත්‍රයෙහි සඳහන් තාක්ෂණ විද්‍යාලවල 2014 අධ්‍යයන වර්ෂයෙහි පැවැත්වීමට නියමිත පාඨමාලා සියල්ල පැවැත්වීම හෝ කිහිපයක් පැවැත්වීම කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි වේ.

ඕනෑම අයදුම්කරුවෙකුට තමන් කැමති ඕනෑම පාඨමාලාවකට වෙන වෙනම ඉල්ලුම් පත්‍රයක් බැගින් ඉදිරිපත් කළ හැක.

එස්. බාලසුබ්‍රමනියම්,
අධ්‍යක්ෂ ජනරාල්,
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව.

තැ. පෙ. 557,
ඕල්කොට් මාවත, කොළඹ 10.
www.dtet.gov.lk

සටහන.-ප්‍රමාණ සමීක්ෂණ තාක්‍ෂණය දිවා හා අර්ධකාල පාඨමාලා සඳහා,

* කළුතර, ගම්පහ, කාර්මික විද්‍යාල සඳහා අයදුම්කරන අයදුම්කරුවන් තම අයදුම්පත් මරදාන තාක්‍ෂණ විද්‍යාලය වෙතත්
* බලපිටිය, මාතර, බෙලිඅත්ත කාර්මික විද්‍යාල සඳහා අයදුම්කරන අයදුම්කරුවන් තම අයදුම්පත් ගාල්ල තාක්‍ෂණ විද්‍යාලය වෙතත්,
* බණ්ඩාරවෙල කාර්මික විද්‍යාලය සඳහා අයදුම්කරන අයදුම්කරුවන් තම අයදුම්පත් බදුල්ල තාක්‍ෂණ විද්‍යාලය වෙතත්,
* කෑගල්ල, වරකාපොල, කාර්මික විද්‍යාල සඳහා අයදුම්කරන අයදුම්කරුවන් තම අයදුම්පත් රත්නපුර තාක්‍ෂණ විද්‍යාලය වෙතත් යොමු කළ යුතුය.

තවද අයදුම් පත්‍රයේ අංක 1 යටතේ තමා අයදුම්කරන කාර්මික විද්‍යාලය අයත්වන තාක්‍ෂණ විද්‍යාලය ලියා වරහන් තුල කාර්මික විද්‍යාලයේ නමද ලිවිය යුතුය. උදා : රත්නපුර තාක්‍ෂණ විද්‍යාලය (කෑගල්ල කාර්මික විද්‍යාලය)

**තාක්‍ෂණ විද්‍යාල ලැයිස්තුව**

| අනු. අංකය | තාක්‍ෂණ විද්‍යාලය | ලිපිනය | දිස්ත්‍රික්කය | දු. ක. අංකය | විද්‍යුත් ලිපිනය |
|---|---|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකා තාක්‍ෂණ විද්‍යාලය, මරදාන | ඕල්කොට් මාවත, කොළඹ 10 | කොළඹ | 011-2324177 | tecmaradana@gmail.com |
| 02 | තාක්‍ෂණ විද්‍යාලය, ගාල්ල | කළුවැල්ල, ගාල්ල | ගාල්ල | 091-2234051 | cotgalle2007@gmail.com |
| 03 | තාක්‍ෂණ විද්‍යාලය, මහනුවර | අරුප්පල, මහනුවර | මහනුවර | 081-2224063 | kandycot@gmail.com |
| 04 | තාක්‍ෂණ විද්‍යාලය, යාපනය | බ්‍රවුන්ස් පාර, යාපනය | යාපනය | 021-2222358 | cotjaffna@gmail.com |
| 05 | තාක්‍ෂණ විද්‍යාලය, බදුල්ල | ග්‍රීන්ලේන් ඩ්‍රයිව්, බදුල්ල | බදුල්ල | 055-2222413 | cotbadulla@gmail.com |
| 06 | තාක්‍ෂණ විද්‍යාලය, අනුරාධපුරය | නව නගරය, අනුරාධපුරය | අනුරාධපුරය | 025-2222666 | cotanuradhapura@gmail.com |
| 07 | තාක්‍ෂණ විද්‍යාලය, කුරුණෑගල | පුත්තලම් පාර, කුරුණෑගල | කුරුණෑගල | 037-2223264 | cotkurunegala@gmail.com |
| 08 | හාඩි තාක්‍ෂණ විද්‍යාලය, අම්පාර | ඉඟිනියාගල පාර, අම්පාර | අම්පාර | 063-2223485 | cotampara@gmail.com |
| 09 | තාක්‍ෂණ විද්‍යාලය, රත්නපුරය | ෆාර්ම් ගාර්ඩ්න්, කොළඹ පාර, රත්නපුරය | රත්නපුරය | 045-2232390 | cotrathnapura@gmail.com |

**තාක්ෂණ විද්‍යාලවල පැවැත්වෙන ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් - 5 (NVQ Level - 5)**
**ඩිප්ලෝමා මට්ටමේ පාඨමාලාවන්ට ඇතුළත්වීම සඳහා සුදුසුකම්**

| අනු. අංකය | පාඨමාලා සංකේත අංකය | පාඨමාලාවේ නම හා ස්වභාවය | පැවැත්වෙන තාක්ෂණ විද්‍යාලය | ඇතුළත්වීමේ සුදුසුකම් පහත දැක්වෙන පාඨමාලාවක් හදාරා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබිය යුතු ය. වයස අවුරුදු 17ට වැඩි විය යුතු ය. |
|---|---|---|---|---|
| 01 | ETB 01 | විදුලි සංදේශ තාක්ෂණය<br><br>පූර්ණ කාල - දිවා<br>දෑ අවුරුදු<br>NVQ 5/6<br>ඒකාබද්ධව පවතී. | ගාල්ල, යාපනය | පරිගණක දෘඩාංග ශිල්පී<br>පරිගණක ජාලකරණ ශිල්පී<br>ගුවන් විදුලි යන්ත්‍ර හා රූපවාහිනී අලුත්වැඩියා කාර්මික |

| *අනු. අංකය* | *පාඨමාලා සංකේත අංකය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *පැවැත්වෙන තාක්ෂණ විද්‍යාලය* | *ඇතුළත්වීමේ සුදුසුකම් පහත දැක්වෙන පාඨමාලාවක් හදාරා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබිය යුතු ය. වයස අවුරුදු 17ට වැඩි විය යුතු ය.* |
|---|---|---|---|---|
| 02 | ETB 04 | මෙකාට්‍රොනික්ස් තාක්ෂණය<br><br>පූර්ණ කාල - දිවා<br>එක් අවුරුදු | මරදාන, ගාල්ල | ගුවන් විදුලි යන්ත්‍ර හා රූපවාහිනී අලුත්වැඩියා කාර්මික<br>පරිගණක දෘඩාංග ශිල්පී<br>විදුලි කාර්මික<br>වායු කාර්මික ශිල්පී<br>මෝටර් රථ කාර්මික ශිල්පී<br>මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී |
| | ETB 04.1 | මෙකාට්‍රොනික්ස් තාක්‍ෂණය<br><br>සති අන්ත/අර්ධ කාල<br>(NVQ Level-5 සඳහා<br>නියමිත පැය ගණන) | මරදාන, ගාල්ල | ගෘහස්ථ විදුලි උපකරණ අලුත්වැඩියා කාර්මික<br>වෑද්දුම්කරු |
| 03 | ETB 06 | ඉදිකිරීම් තාක්ෂණය<br><br>පූර්ණ කාල - දිවා<br>එක් අවුරුදු | බදුල්ල, කුරුණෑගල<br>අනුරාධපුර, මහනුවර<br>රත්නපුර, | ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්පී<br>ලී වැඩ ශිල්පී (ඉදිකිරීම්)<br>ඉදිකිරීම් ක්ෂේත්‍ර පරීක්ෂක<br>ජලනල ශිල්පී<br>කර්මාන්ත ජලනල ශිල්පී |
| | ETB 06.1 | ඉදිකිරීම් තාක්ෂණය<br>(සති අන්ත/අර්ධ කාල)<br>(NVQ Level -5 සඳහා<br>නියමිත පැය ගණන | ගාල්ල, අම්පාර,<br>යාපනය, රත්නපුර<br>කුරුණෑගල | ගොඩනැගිලි පින්තාරු ශිල්පී<br>සැලසුම් ශිල්පී<br>සහකාර ප්‍රමාණ සමීක්‍ෂක |
| 04 | ETB 07 | මෝටර් රථ තාක්ෂණය<br><br>පූර්ණ කාල - දිවා<br>එක් අවුරුදු | අම්පාර, යාපනය,<br>කුරුණෑගල<br>මහනුවර, බදුල්ල | මෝටර් රථ කාර්මික ශිල්පී<br>මෝටර් රථ කාර්මික විදුලි ශිල්පී<br>මෝටර් රථ පින්තාරුකරු<br>මෝටර් සයිකල් සහ ත්‍රීරෝද රථ කාර්මික<br>ත්‍රීරෝද රථ කාර්මික |
| | ETB 07.1 | මෝටර් රථ තාක්‍ෂණය<br>(සති අන්ත/අර්ධකාල)<br>(NVQ Level-5 සඳහා<br>නියමිත පැය ගණන) | කුරුණෑගල<br>යාපනය, මහනුවර | |
| 05 | ETB 08 | ශීතකරණ හා<br>වායුසමන තාක්ෂණය<br><br>පූර්ණ කාල - දිවා<br>එක් අවුරුදු | අනුරාධපුර,<br>රත්නපුර<br>මහනුවර | ශීතකරණ හා වායුසමන කාර්මික ශිල්පී<br>මෝටර් රථ වායුසමන ශිල්පී<br>මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී<br>ගෘහස්ථ විදුලි උපකරණ අලුත්වැඩියා කාර්මික<br>විදුලි ශිල්පී |
| | ETB 08.1 | ශීතකරණ හා<br>වායුසමන තාක්‍ෂණය<br><br>(සති අන්ත/අර්ධකාල)<br>(NVQ Level-5 සඳහා<br>නියමිත පැය ගණන) | රත්නපුර, අනුරාධපුර | |
| 06 | ETB 09 | ගොවි යන්ත්‍රෝපකරණ<br>තාක්ෂණය<br>පූර්ණ කාල-දිවා<br>එක් අවුරුදු | අනුරාධපුර | තේ කර්මාන්ත ශාලා යාන්ත්‍රික ශිල්පී<br>කෘෂි උපකරණ අළුත්වැඩියා කාර්මික<br>මෝටර් රථ කාර්මික ශිල්පී<br>යාන්ත්‍ර ශිල්පී<br>ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා කර්මික |
| | ETB 09.1 | ගොවියන්ත්‍රෝපකරණ<br>තාක්‍ෂණය | අනුරාධපුර | |

| *අනු. අංකය* | *පාඨමාලා සංකේත අංකය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *පැවැත්වෙන තාක්ෂණ විද්‍යාලය* | *ඇතුළත්වීමේ සුදුසුකම් පහත දැක්වෙන පාඨමාලාවක් හදාරා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබිය යුතු ය. වයස අවුරුදු 17ට වැඩි විය යුතු ය.* |
|---|---|---|---|---|
| | | (සති අන්ත/අර්ධකාල) (NVQ Level-5 සඳහා නියමිත පැය ගණන) | | |
| 07 | ETB 11 | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පූර්ණ කාල - දිවා එක් අවුරුදු | මරදාන, මහනුවර ගාල්ල, බදුල්ල රත්නපුර, යාපනය කුරුණෑගල, කෑගල්ල, අම්පාර | තොරතුරු සන්නිවේදන තාක්ෂණ ශිල්පී<br>පරිගණක යෙදවුම් සහායක<br>පරිගණක "ග්‍රැෆික් ඩිසයින්" ශිල්පී<br>පරිගණක දෘඩාංග ශිල්පී<br>පරිගණක ප්‍රකාශන ශිල්පී (Desktop Publisher)<br>පරිගණක ජාලකරණ ශිල්පී |
| | ETB 11.1 | තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණය<br><br>(සති අන්ත/ අර්ධකාල) (NVQ Level-5 සඳහා නියමිත පැය ගණන) | ගාල්ල, රත්නපුර, මරදාන, අනුරාධපුරය, යාපනය | |
| 08 | ETB 12 | පැස්සුම් තාක්ෂණය පූර්ණ කාල - දිවා එක් අවුරුදු | මරදාන | පැස්සුම්කරු<br>ලෝහ පිරිසකරකරු<br>මෝටර් වාහන වැද්දුම් ශිල්පී<br>වැද්දුම්කරු |
| | ETB 12.1 | පැස්සුම් තාක්‍ෂණය (සති අන්ත/ අර්ධකාල) (NVQ Level-5 සඳහා නියමිත පැය ගණන) | මරදාන | |
| 09 | ETB 14 | ආහාර තාක්ෂණය පූර්ණ කාල - දිවා එක් අවුරුදු | මහනුවර | බේකරි ශිල්පී<br>පළතුරු සහ එළවළු සැකසුම් ශිල්පී<br>සූපවේදී |
| | ETB 14.1 | ආහාර තාක්‍ෂණය<br><br>(සති අන්ත/ අර්ධකාල) (NVQ Level-5 සඳහා නියමිත පැය ගණන) | මහනුවර | |
| 10 | ETB 15 | ස්වර්ණාභරණ නිර්මාණය හා නිෂ්පාදන තාක්ෂණය පූර්ණ කාල - දිවා එක් අවුරුදු | මරදාන | ස්වර්ණාභරණ සාදන්නා<br>ස්වර්ණාභරණ ගල් බැඳුම් ශිල්පී |
| | ETB 15.1 | ස්වර්ණාභරණ නිර්මාණය හා නිෂ්පාදන තාක්‍ෂණය<br><br>(සති අන්ත/ අර්ධකාල) (NVQ Level-5 සඳහා නියමිත පැය ගණන) | මරදාන | |

| *අනු. අංකය* | *පාඨමාලා සංකේත අංකය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *පැවැත්වෙන තාක්ෂණ විද්‍යාලය* | *ඇතුළත්වීමේ සුදුසුකම් පහත දැක්වෙන පාඨමාලාවක් හදාරා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබිය යුතු ය. වයස අවුරුදු 17ට වැඩි විය යුතු ය.* |
|---|---|---|---|---|
| 11 | ETB 16 | නිෂ්පාදන තාක්ෂණය<br>පූර්ණ කාල - දිවා<br>එක් අවුරුදු | මහනුවර | ඇළුමිනියම් පිරිසකර කරන්නා<br>යන්ත්‍ර ශිල්පී<br>ආවුධ සහ අච්චු තැනීමේ ශිල්පී<br>පෑස්සුම් ශිල්පී<br>ලෝහ පිරිසකරකරු<br>වෑද්දුම්කරු |
| 12 | ETB 17 | ප්‍රමාණ සමීක්ෂණ තාක්ෂණය<br>පූර්ණ කාල - දිවා<br>එක් අවුරුදු<br><br>*(NVQ -5 සහතිකය ලබා ගැනීමට පෙර NVQ - 4 මට්ටමේ මොඩියුල සම්පූර්ණ කර ඇගයීම් සමත්ව සිටිය යුතු ය. | මහනුවර, රත්නපුර, වරකාපොල, ගාල්ල, කෑගල්ල, මරදාන, බදුල්ල, බණ්ඩාරවෙල, අනුරාධපුරය, අම්පාර යාපනය, ගම්පහ, මාතර, කුරුණෑගල, බලපිටිය, බෙලිඅත්ත, කළුතර | අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් ගණිතය, විද්‍යාව, සහ මාධ්‍ය භාෂාව ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සහිතව විෂයයන් හයක් (06ක්) එකවර සමත්ව සිටිය යුතු ය. ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබිය යුතු ය.<br><br>අ. පො. ස. (උ. පෙළ) විභාගයේ ශුද්ධ ගණිතය/ ව්‍යවහාරික ගණිතය හෝ සංයුක්ත ගණිතය සහ/හෝ දෘඩ තාක්‍ෂණ විෂයයක් හදාරා ඇති අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. |
| | ETB 17.1 | ප්‍රමාණ සමීක්ෂණ තාක්ෂණය<br>සති අන්ත/අර්ධ කාල<br>NVQ Level -5 සඳහා නියමිත පැය ගණන)<br><br>*(NVQ -5 සහතිකය ලබා ගැනීමට පෙර NVQ - 4 මට්ටමේ මොඩියුල සම්පූර්ණ කර ඇගයීම් සමත්ව සිටිය යුතු ය. | මහනුවර, රත්නපුර, මරදාන, අනුරාධපුරය යාපනය, කුරුණෑගල මාතර | |

*ආදර්ශ අයදුම්පත්‍රය*

*තාක්ෂණ විද්‍යාලයන්හි පැවැත්වෙන ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 5 (NVQ Level 5) ඩිප්ලෝමා මට්ටමේ පාඨමාලා සඳහා ඇතුළත් කර ගැනීමේ අයදුම්පත්‍රය - 2014 අධ්‍යයන වසර*

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි

01. ඉල්ලුම් කරනු ලබන තාක්ෂණ විද්‍යාලයේ නම :————.

02. පාඨමාලාවේ නම :————. (පූර්ණ කාලීන/දිවා/සන්ධ්‍යා/අර්ධ කාලීන)

03. පාඨමාලා සංකේත අංකය :————.

04. අයදුම්කරුගේ මුල'කුරු සමග නම :————.

05. මුල'කුරුවලින් හැඳින්වෙන නම් :————.

06. ස්ථිර ලිපිනය :————.

07. සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකය :————. ඊ-මේල් :————.

08. ජාතික හැඳුනුම්පත් අංකය :————.

09. *දිස්ත්‍රික්කය* :————. ඡන්ද කොට්ඨාසය :————.
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

10. *උපන් දිනය* :————.
2014.01.01 වැනි දිනට වයස :

අවුරුදු :————. මාස :————. දින :————.

11. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

12. *ඇතුළත්වීමේ සුදුසුකම් : ගැසට් නිවේදනයේ දක්වා ඇති පරිදි ඔබ ලබා ඇති සුදුසුකම් පහත සඳහන් අදාළ කොටුවේ සඳහන් කරන්න. :*

| පාඨමාලාවට ඇතුළත්වීමේ සුදුසුකම්/සහතික පිළිබඳ විස්තර | | | | |
|---|---|---|---|---|
| *ලබා ඇති සහතිකයේ නම* | *NVQ මට්ටම* | *පාඨමාලාව හැදෑරූ ආයතනයේ නම* | *අදාළ සේවා පළපුරුද්ද ඇත්නම් ඒ පිළිබඳ විස්තර කෙටියෙන්* | *සේවා කාලය*<br>*අවුරුදු / මාස* |
| | | | | |
| | | | | |

13. *අධ්‍යාපන සුදුසුකම් :*

(අ) අ.පො.ස. (සා.පෙළ) ප්‍රතිඵල (දෙවරකට නොවැඩි වාර ගණනක දී)

| *විභාග අංකය* | *විභාගයට පෙනී සිටි වර්ෂය* | *විෂයයන්* | *ලබාගත් ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |

(ආ) අ.පො.ස. (උ. පෙළ) ප්‍රතිඵල :

| *විභාග අංකය* | *විභාගයට පෙනී සිටි වර්ෂය* | *විෂයයන්* | *ලබාගත් ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |

14. *අයදුම්කරුගේ ප්‍රකාශය :*

මවිසින් මෙහි සඳහන් කර ඇති තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බවත්, ඉල්ලුම්කොට ඇති පාඨමාලාවට අවශ්‍ය සුදුසුකම් මා සපුරා ඇති බවත්, මෙයින් සහතික කරමි. තව ද තාක්ෂණ විද්‍යාලයට සිසුන් ඇතුළත් කිරීම පිළිබඳ පරිපාටියට එකඟවීමට ද, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අවසාන තීරණය පිළිගැනීමට ද පොරොන්දු වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

රු. 10 ක මුද්දර අලවා ඒ මත අත්සන තබා අවලංගු කරන්න.

12-1246

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.